00025

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර වැඩ සටහන

අවසාන පරීක්ෂණය - **2021/2022**

**EPC1336/ESC1136 -** ගණිත කුසලතා සංවර්ධනය

කාලය - පැය දෙකයි. **(02)**

---

දිනය - 2023.06.18 වේලාව - පෙ.ව.09.30 - පෙ.ව.11.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට ද **(03)** පිළිතුරු සපයන්න.

## <u>පළමු වන කොටස</u>

01. පියාජේගේ බුද්ධි සංවර්ධන අවධීන් වයසත් සමග ලැයිස්තු ගත කරන්න.

02. නිරීක්ෂණාත්මක ඉගෙනුම යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න.

03. ස්වභාවික ආකාරයට දරුවන් ගණිත සංකල්ප ඉගෙන ගන්නා ආකාර තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න.

04. එකට එක අනුරූපතාව යන ගණිත සංකල්පය තේරුම් ගැනීමට අදාළ අත්දැකීම් දරුවන්ට ලබාදීමේ වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න.

05. තේරීම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? තේරීමේ ක්‍රියාකාරකම්වලදී භාවිතා කළ හැකි වර්ග හතර **(04)** සඳහන් කරන්න.

06. පහත දැක්වෙන ජ්‍යාමිතික හැඩතල පහසුවෙන් හඳුනා ගැනීම සඳහා උදව් වන ඔහුගේ/ඇයගේ පරිසරය තුළ ඇති දේවල් නම් කරන්න.

a) සමචතුරස්‍රය

b) රවුම

c) ත්‍රිකෝණය

d) සෘජුකෝණාස්‍රය

e) ඕවලාකාර

00025

07. දරුවන්ට තාර්කික සම්බන්ධතා සහ තර්ක කිරීමේ කුසලතා සංවර්ධනයට, අනුපිළිවෙල සහ රටා උදව්වන අයුරු විශ්ලේෂණය කරන්න.


08. පෙරපාසල් දරුවන්තුළ පිහිටීම/අසර යන ගණිත සංකල්පය සංවර්ධනය කිරීමේ වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න.


(ලකුණු 05 x 08 = 40)


## දෙවන කොටස


09. I. 'සමමිතිය' යන යෙදුමෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

II. පහත දැක්වෙන හැඩතල ඔබගේ පිළිතුරු පත්‍රයේ ඇඳ ඒවායේ සමමිතික අක්ෂය නිවැරදිව ඇඳ පෙන්වන්න. (ලකුණු 04)

a) 

b) 

c) 

d) 

III. පෙර පාසල් දරුවන් තුළ සමමිතිය යන ගණිත සංකල්පය සංවර්ධනය කිරීමට අදාළ සුදුසු ක්‍රියාකාරකමක් ලියන්න. (ලකුණු 12)

10. I. අච්චලතාවය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

II. අච්චලතාවය යන ගණිත සංකල්පය සංවර්ධනය කිරීමට උචිත ක්‍රියාකාරකමක් ලියන්න. (ලකුණු 08)

III. ද්‍රවයක අච්චලතාව යන ගණිත සංකල්පය සංවර්ධනය කිරීම සඳහා උචිත ක්‍රියාකාරකමක් ලියන්න. (ලකුණු 08)

11. I. පෙර පාසල් දරුවන්ට සංඛ්‍යා සංකල්පය හඳුන්වා දීමේ දී අනුගමනය කළයුතු පියවරයන් පිළිවෙලට ලියන්න. (ලකුණු 05)

II. පෙර පාසල් දරුවන්ට සංඛ්‍යා යන ගණිත සංකල්පය හඳුන්වා දීම සඳහා ඔබ ක්‍රියාකාරකමක් සංවිධානය කරන අයුරු ලියන්න. (ලකුණු 15)

12. I. පටිපාටිගත කිරීම යන ගණිත සංකල්පයේ ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

II. පෙරපාසල් දරුවන්ට පටිපාටිගත කිරීම යන ගණිත සංකල්පය හඳුන්වා දීම සඳහා උචිත ක්‍රියාකාරකමක් යොදා ගන්නා ඉගෙනුම් - ඉගැන්වීම් උපකරණ ද සමඟ ලියන්න. (ලකුණු 15)

13. I. 'මිනුම්' යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

II. පෙර පාසල් දරුවන්ට හඳුන්වා දිය හැකි මිනුම් වර්ග හතර **(04)** සඳහන් කරන්න. (ලකුණු 04)

III. ඔබ ඉහත සඳහන් කළ එක් මිනුම් වර්ගයක් තෝරාගෙන එය සංවර්ධනය කිරීම සඳහා උචිත ක්‍රියාකාරකමක් අවශ්‍ය ඉගෙනුම්-ඉගැන්වීම් ද්‍රව්‍යය ද සඳහන් කරමින් ලියන්න. (ලකුණු 12)

හිමිකම් ඇවිරිණි.